


# මේ අජේ උදාර වූ මාතෘ භූමියද ?

**සෝවියට් රුසියාවේ බිඳවැටීම සමස්ථ ලෝකයට අහිතකර ලෙස බලපෑවේ යම් සේද එයටත් වඩා අහිතකර ලෙස 1977 විවෘත ආර්ථික ක්‍රමය ශ්‍රී ලාංකික සමාජ දේහය මත මාරාන්තික තුවාල ඇති කළේය. අද එය දරුණු ලේ පිළිකාවක් සේ මාතෘ භූමියේ සියලු ලේ නහර ඇට මිදුලු ආක්‍රමණය කොට තිබේ.**

ස්වභාවික සම්පත් මංකොල්ලය හා දේශපාලන බලය අත්පත් කරගැනීම අරඹයා දිනෙන් දින විපරිත වන ලෝක දේශපාලන ගමන් මග සකලවිධ මනුෂ්‍ය වර්ගයාටම අහිතකර වටපිටාවක් නිර්මාණය කරමින් තිබේ. එක් පසකින් නව යටත්විජිතකරණ ක්‍රියාවලිය දිලිඳු රටවල් මතට වියරු තෙරපුමක් ඇතිකොට ඒවායෙහි අභ්‍යන්තර සාමය හා සමෘද්ධිය අහිමි කරමින් තිබෙන අතර අනෙක් පසින් මිනිස් වටිනාකම් මූල්‍යමය තුලාවක දා තක්සේරු කිරීම හෙවත් පිරිපුන් මනුෂ්‍ය ආධ්‍යාත්මය ලෙඩ කිරීම ලෝක පරිමාණව සිදුකෙරෙමින් තිබේ.

ඇමරිකා එක්සත් ජනපදය හා ඔවුනට ගැති රටවල් ඉරාකය මත මුදාහල අති බිහිසුනු අමානුෂිකත්වය හමුවේ සෙසු ලෝකය දෙනුවන් දෙසවන් අහිමි වූවන් සේ හැසුරුණු අයුරු මෙනෙහි කරන විට අනාගත මනුෂ්‍ය වර්ගයාගෙ ' ඉරණම පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ඇතිකර ගැනීමට අපහසු නොවේ. මනුෂ්‍යත්වයට අහිතකර ජාත්‍යන්තර දේශපාලනයේ පළමු වෙඩි මුරය සෝවියට් රුසියාවේ බිඳ වැටීමත් සමඟ සිදුවූයේ යැයි මම සිතමි. එතැන්සිට ඇරඹි නව ජාත්‍යන්තර දේශපාලන විපරිණාමය කිසිසේත් මිනිස් සංහතියට හිතකර අතට විතැන් වන අයුරු දැකගත හැකි නොවේ. එය පෘථිවිය තුලින් සාමයත් මනුෂ්‍යත්වයත් දුරස් කරමින්ද ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් විවිධ ගැටුම් නිර්මාණය කරමින්ද සිටී.

සෝවියට් රුසියාවේ බිඳවැටීම සමස්ථ ලෝකයට අහිතකර ලෙස බලපෑවේ යම් සේද එයටත් වඩා අහිතකර ලෙස 1977 විවෘත ආර්ථික ක්‍රමය ශ්‍රී ලාංකික සමාජ දේහය මත මාරාන්තික තුවාල ඇති කළේය. අද එය දරුණු ලේ පිළිකාවක් සේ මාතෘ භූමියේ සියලු ලේ නහර ඇට මිදුළු ආක්‍රමණය කොට තිබේ. එමගින් ජාතික ආර්ථිකයට මෙන්ම ආධ්‍යාත්මයටද ඇතිකොට තිබෙන ව්‍යසනය සුළු පටු නොවේ.

ඊට දේශපාලඥයන් නියම කරනු ලබන ප්‍රතිකාරද රෝග නිධානය හඳුනාගනිමින් සිදුකරන්නක් නොව සිය පෞද්ගලික පැවැත්ම තහවුරු කරගැනීම සඳහා සමාජය මතට මුදාහරින නිර්වින්දන බෙහෙත්මය. එමෙන්ම සමාජය වෙතින් ඊට යම් ප්‍රතිවිරෝධ මතු වුවද එයද පක්ෂ දේශපාලනය නම් වූ විය ගස යටට ගාල් කොට තම දේශපාලන බල උවමනාවන් වෙත දක්කාගෙන යාම මගින් එම සැබෑ ජනතා ප්‍රතිවිරෝධයන් හුදකලා කොට තිබේ. පුදුමය වන්නේ මෙම සමාජ ප්‍රතිවිරෝධයන් ප්‍රසස්ත කලා කෘති මතින් හෝ පැමිණ ජන විඥණය අවධි නොකිරීමයි. පූර්ව විප්ලවීය රුසියාව වසා පැවති සාර් රජුගේ ඒකාධිපති පාලනය හා එහි ජන ජීවිතය ඇද දමා තිබූ ව්‍යාධිය එරට සාහිත්‍යකරුවන් ප්‍රබල ලෙස තම නිර්මාණ සඳහා විෂය කරගත්හ. ඔවුන් එරට පොදු ජන විඥාණය වඩා යහපත් මිනිස් සමාජයක් නිර්මාණය කිරීමේ අරුතින් මෙහෙයැවීය.

ලියෝ තෝල්ස්තෝයි රුසියානු විප්ලවයේ කැඩපත ලෙස ලෙනින් පැවසුවේ එම ඓතිහාසික සාහිත්‍ය කලා මෙහෙවර නිසාවෙනි. රුසියනු සාහිත්‍යකරුවන්ගේ කලා ව්‍යාපාරය හුදකලා කිරීමට සාර් පාලනයට හැකි නොවීය. එහෙත් ශ්‍රී ලංකාව තුළ අප අත්දකින යථාර්ථය රය නොවේ. ජේ. ආර්. ගේ විවෘත ආර්ථික පිළිවෙත සාර් පාලනයට වඩා දරුණු වී ඇති බව මගේ හැඟීමයි. එනම් මෙම ආර්ථික වෙනස රටේ නිශ්පාදන ආර්ථිකය යැපුම් ආර්ථිකයක් වෙතට විතැන් කොට රට අන්ත දිළිඳු භාවයකට පත්කළා පමණක් නොව මුළු මහත් කලා සංස්කෘතික විඥාණයද මුලිනුපුටා කලාකරුවන් දෘෂ්ටිමය වඳභාවයට තල්ලුකොට තිබේ. ඛලීල් ජිබ්රාන් කිව්වා සේම කලාව "බහුබූතයක අනුකරණයක් " වී තිබේ. බුද්ධිමතුන් දෙනුවන් දෙසවන් නැතිවුන් සේ නිහඬ පිළිවෙතක් වෙත සීරුමාරු වී ඇති අතර ඔවුන් තම හතර මායිමේ ආරක්ෂාව වෙනුවෙන් පමණක් වෙහෙසෙනු දැකගත හැකිය. නොඑසේනම් දේශපාලඥයින්ගේ දොල පිදේනි ලබමින් ඔවුන් සන්තර්පනය කරමින්ද ඔවුන්ගේ පාලන තන්ත්‍රය මුර කරමින්ද සිටියි. බොහොමයක් මාධ්‍ය ආයතන සිය අයිතිකරුවන්ගේ නිශ්පාදන අලෙවි කරමින්ද, ඔවුනට දේශපාලන රැකවරණ සලසමින්ද, තරුණ පරපුරේ චින්තනය හා විනදනය විනාශ කරමින්ද රටේ මරණ සහතිකය ලියමින් සිටියි.

ශ්‍රී ලංකාව වූ කලී උසස් ශිෂ්ඨාචාරයකින් පොහොසත්ව පැවති රටක් බවට ඉතිරි වී ඇති නටඹුන් තහවුරුකොට තිබේ. ඒ විශිෂ්ඨ යුගය නිර්මාණය කළ මහා පුරුෂයින් අද අප අතර නැත. ඔවුන් නිර්මාණය කර විශිෂ්‍ය කෘෂි ආර්ථිකය සුසංවර්ධනය කරනු වෙනුවට මෑත ඉතිහාසය තුළ අප දුටුවේ ගෙවියන් වස පානය කොට මිය යන තැනට කෘෂි ආර්ථිකය ඇද දැමූ පාලකයන්ය. වී අලෙවි කරගත නොහැකිව එසේ වස පානය කොට මිය ගිය ගොවීන් මතින් බලයට පැමිණ යලිත් එම අරගලය පාවා දුන් පාලකයන්ය. මාධ්‍යකරුවන්, නිදහස් චින්තකයින්, කලාකරුවන් විකුණා බලයට පැමිණි පාලකයන්ය. එබැවින් අපගේ මෑත ඉතිහාසය වූ කලී අපට රන් අකුරින් ලිවිය හැකි යමක් ඉතිරිකොට තිබේ නම් ඒ අල්ප වශයෙනි. එබැවින් අතීතකාමයෙන් අපට තවදුරටත් අන්ධ වී සිටිය හැකිද? සැබවින්ම නොහැකිය. මන්ද අප පයාගසා සිටින වර්ථමානය වූ කලී අඳුරින් හා කඳුලින් ගහන යාමයකි. ඉන් මාතෘ භූමිය මුදවා ගතහැකි ප්‍රඥාවක් පහල වන්නේ කවදාද? අප අභිමුව ඇති වේදනාබර පැනය එයයි.

රවි සිරිවර්ධන
ravi.siriwardhana@gmail.com


ඔබේ සොඳුරු මංගල දිනයේ



ඔබේ සොඳුරු මංගල දිනයේ
අපේ සම්ප්‍රදායික රටාවෙන් හා
නවීන විලාසිතාවෙන්
පිරිපුන් මනාලියක දක්වා හැඩ වීමට

මනාලියන්ගේ මල් කළඹ සැකසීම

ඔබේ සියලුම රූපලාවන්‍ය කටයුතු
එකම තැනකදී පහසු මිලකට

- කාන්තා කොණ්ඩා කැපීම හා කොණ්ඩා මෝස්තර
- ෆර්ම් කිරීම ස්ට්‍රේට් කිරීම කලර් කිරීම
- ටින්ට් කිරීම රිබොන්ඩිං කිරීම
- ෆේෂල් කිරීම වැක්ස් කිරීම
- ත්‍රෙඩින් කිරීම මුහුණ බ්ලීච් කිරීම සම බ්ලීච් කිරීම ඇතුලු සියලුම රූපලාවන්‍ය කටයුතු සඳහා

දස වසරක පළපුරුද්ද සමගින්
උසස් ඩිප්ලෝමාධාරිණී

**ප්‍රෂානි සුරවීර**

*Salon Colour Box*

14 Winterton Close
Epping
**TP 9401 3727 / 0425 805 754**



# GATEWAY LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

***Professional, Quality Service Assured***

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila